# පුරප්පාඩු

## ජාතික විද්‍යා පදනම
## தேசிய விஞ்ஞான மன்றம்
## National Science Foundation

NATIONAL SCIENCE FOUNDATION

ජාතික විද්‍යා පදනම 1994 අංක 11 දරණ, විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත මගින් ස්ථාපිත විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය රටේ තිරසාර සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා විද්‍යාව සහ තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමේ කර්තව්‍යයේ නියැලී සිටී. පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී (01)

**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1) සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂිවිද්‍යාව, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, සංඛ්‍යානය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාවේදී උපාධියක්.

**සහ**

ඉහත විෂය ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් සමග සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද.

2) සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂි විද්‍යාව, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, සංඛ්‍යානය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විද්‍යාවේදී උපාධියක්.

**සහ**

සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය ඇතුළුව විද්‍යාව සම්බන්ධයෙන් වන දර්ශනපති හෝ විද්‍යාපති උපාධියක් (පර්යේෂණ සංරචකයක් සහිතව අවම වශයෙන් වසර දෙකක උපාධිය) සමග සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

ජාතික විද්‍යා පදනමේ ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී (AR 2) තනතුරේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

HM 1-3 රු. 152,500 – 15x4,100 – 214,000/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 133,028/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 2. ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී (01)

**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂි විද්‍යාව, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, සංඛ්‍යානය හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක සුදුසු විෂය සංයෝජනයන් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී විශේෂ උපාධිය සමග මණ්ඩලයට පිළිගත හැකි සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන

කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයෙහි හෝ අන් කවර හෝ අදාළ ක්ෂේත්‍රයකින් ලබා ගත් පශ්චාත් උපාධියක්.

**සහ**

පළමු උපාධිය ලබාගැනීමෙන් පසුව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) පර්යේෂණ ආශ්‍රිත පළපුරුද්ද.

2) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂිවිද්‍යාව, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, සංඛ්‍යානය හෝ අදාළ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයකින් ලබාගත් විද්‍යාවේදී විශේෂ උපාධියක් සමග මණ්ඩලයට පිළිගත හැකි සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයෙහි හෝ අන් කවර හෝ අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක්.

**සහ**

පළමු උපාධිය ලබාගැනීමෙන් පසුව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (05) පර්යේෂණ ආශ්‍රිත පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2 හෝ 3)**

1) ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.

2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ විශේෂ/සාමාන්‍ය උපාධියක් (අයදුම්කරු විසින් අදාළ විෂය ක්ෂේත්‍රය සඳහන් කළ යුතුය.)

**සමග**

අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි සුදුසුකම (විද්‍යාපති) සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අධ්‍යයන/පර්යේෂණ කාණ්ඩයේ (AR 1) තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

3) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ විශේෂ/සාමාන්‍ය උපාධියක් (අයදුම්කරු විසින් අදාළ විෂය ක්ෂේත්‍රය සඳහන් කළ යුතුය.)

**සමග**

අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධිය.

**සහ**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අධ්‍යයන/පර්යේෂණ කාණ්ඩයේ (AR 1) තනතුරක අවම වශයෙන් වසර පහක (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 35ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

AR 2 රු. 133,220 – 10x3,600 – 169,220/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 116,763/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 3. විද්‍යාත්මක නිලධාරී (08)

**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂි විද්‍යාව, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, සංඛ්‍යානය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සහ මණ්ඩලයට පිළිගත හැකි විද්‍යාවේදී විශේෂ උපාධියක්.

2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂිවිද්‍යාව, ආර්ථික විද්‍යාව, පරිගණක විද්‍යාව, සංඛ්‍යානය හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සහ මණ්ඩලයට පිළිගත හැකි විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක්.

**සමග**

අදාළ ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධියක්/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (පර්යේෂණ සංරචකය සහිතව අවම වශයෙන් වසර දෙක (02) ක උපාධිය.)

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

AR 1 රු. 91,650 – 10x2,480 – 15x3,450 –168,200/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 81,675/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්.

**හෝ**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 4. තොරතුරු නිලධාරී (02)

**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1) විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පරිගණක විද්‍යාව, සමාජ විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සහ මණ්ඩලයට පිළිගත හැකි විශේෂ උපාධියක්.

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යාපාරික ආයතනයක අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2) විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පරිගණක විද්‍යාව, සමාජ විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් සාමාන්‍ය උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මණ්ඩලය විසින් පිළිගත් වෙනත් අදාළ ක්ෂේත්‍රයකින් ලබාගත් පශ්චාත් උපාධියක්.

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක/මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යාපාරික ආයතනයක අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.

2) ජාතික විද්‍යා පදනමේ කණිෂ්ඨ කළමනාකරණ (JM) මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

MM 1-1 රු. 91,690 – 10x2,480 – 15x3,450 –168,240/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 81,710/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 5. රහස්‍ය ලේකම් (කොන්ත්‍රාත් පදනම) (02)

**බාහිර අයදුම්කරුවන්:**

1) සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හය (06) කින් අ.පො.ස. සා.පෙළ විභාගයෙන් සමත් වීම.

**සහ**

2) අ.පො.ස. උ.පෙළ විභාගයෙන් විෂයන් තුනක් (03) සමත් වීම සහ වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය හෝ පිළිගත් ආයතනයක ලේකම් පරිචය පිළිබඳ අවුරුදු 2කට නොඅඩු ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

**සහ**

3) රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අදාළ ලේකම් තනතුරෙහි අවම වශයෙන් වසර 10 සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

JM 1-2 රු. 74,010 – 10x1,360 – 18x2,040 – 124,330/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 66,781/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්.

**හෝ**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 6. පොත් තබන්නා (කොන්ත්‍රාත් පදනම) (02)

**බාහිර අයදුම්කරුවන්:**

<u>වෘත්තීය:</u>

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් පහ මට්ටමට (NVQ Level 05) නොඅඩු ගිණුම්කරණය/පොත් තැබීම හා ඊහා සමාන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

පහත සඳහන් සුදුසුකම් ඇති කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන), ප්‍රාථමික-පුහුණු, ප්‍රාථමික-අර්ධ පුහුණු සහ ප්‍රාථමික-නුපුහුණු සේවා කාණ්ඩවල සේවකයින් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

1) ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.

2) AAT/Book Keeping අවසන් විභාගය හෝ ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට (NVQ Level 05) නොඅඩු හෝ ඒ හා සමාන සුදුසුකම් සහිතව ජාතික විද්‍යා පදනමේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

MA 2-2 රු. 50,540 – 10x540 – 7x630 – 4x1,080 – 20x1,280 – 90,270/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 46,960/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්.

**හෝ**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 7. පුස්තකාල සහකාර (කොන්ත්‍රාත් පදනම) (02)

**බාහිර අයදුම්කරුවන්:**

**වෘත්තීය:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට (NVQ Level 05) නොඅඩු හෝ පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳව හෝ ඊහා සමාන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

පහත සඳහන් සුදුසුකම් ඇති කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන), ප්‍රාථමික-පුහුණු, ප්‍රාථමික-අර්ධ පුහුණු සහ ප්‍රාථමික-නුපුහුණු සේවා කාණ්ඩවල සේවකයින් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

1) ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.

2) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පළමු විභාගය සමත්වීම හෝ ඊහා සමාන සුදුසුකමක් සපුරා තිබීම.

**සහ**

ජාතික විද්‍යා පදනමේ ඉහත සේවක කාණ්ඩයන් යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

MA 2-2 රු. 50,540 – 10x540 – 7x630 – 4x1,080 – 20x1,280 – 90,270/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 46,960/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්.

**හෝ**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 8. ග්‍රැෆික් නිර්මාණ සහකාර (කොන්ත්‍රාත් පදනම) (02)

**බාහිර අයදුම්කරුවන්:**

**වෘත්තීය:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට (NVQ Level 05) නොඅඩු ග්‍රැෆික් නිර්මාණ පිළිබඳව හෝ ඊහා සමාන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

පහත සඳහන් සුදුසුකම් ඇති කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන), ප්‍රාථමික-පුහුණු, ප්‍රාථමික-අර්ධ පුහුණු සහ ප්‍රාථමික-නුපුහුණු සේවා කාණ්ඩවල සේවකයින් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

1) ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.

2) ග්‍රැෆික් නිර්මාණකරණය පිළිබඳ වසර එකක (01) සහතිකපත්‍ර පාඨමාලාවක් හෝ ඊහා සමාන ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමේ (NVQ Level 5 ට නොඅඩු) ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

ජාතික විද්‍යා පදනමේ ඉහත සේවක කාණ්ඩයන් යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

MA 2-2 රු. 50,540 – 10x540 – 7x630 – 4x1,080 – 20x1,280 – 90,270/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 46,960/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්.

**හෝ**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 9. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (12)

**බාහිර අයදුම්කරුවන්:**

**<u>අධ්‍යාපනික:</u>**

1) සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය එකවර සමත්වීම.

**සහ**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) විෂයයන් තුනක් (03) සමත්වීම.

**<u>විශේෂ නිපුණතා:</u>**

- පරිගණක මෘදුකාංග භාවිතා කිරීමේ හැකියාව.
- සිංහල සහ ඉංග්‍රීසි බසින් පරිගණක යතුරු ලියනය කිරීමේ හැකියාව.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

පහත සඳහන් සුදුසුකම් ඇති ප්‍රාථමික-පුහුණු, ප්‍රාථමික-අර්ධ පුහුණු සහ ප්‍රාථමික-නුපුහුණු සේවා කාණ්ඩවල සේවකයින් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**<u>අධ්‍යාපනික:</u>**

සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.

**සහ**

ජාතික විද්‍යා පදනමේ ඉහත සේවක කාණ්ඩයන් යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**<u>විශේෂ නිපුණතා:</u>**

- පරිගණක මෘදුකාංග භාවිතා කිරීමේ හැකියාව.
- සිංහල සහ ඉංග්‍රීසි බසින් පරිගණක යතුරු ලියනය කිරීමේ හැකියාව.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

MA 1-2 රු. 46,220 –10x540 – 7x630 – 12x1,080 – 12x1,280 – 84,350/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 43,312/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක්.

**හෝ**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 10. කාර්මික ශිල්පී (විදුලි හා ඉලෙක්ට්‍රොනික) (01)

**බාහිර අයදුම්කරුවන්:**

තනතුරේ කාර්යයන්ට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් හතර (NVQ Level 04) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුන (03) ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.

2) වෘත්තීය පරීක්ෂණයකදී ඔප්පු කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් දෙක (NVQ Level 02) මට්ටමට නොඅඩු කුසලතා සහිතව ප්‍රාථමික-අර්ධ පුහුණු (PL 2) හෝ ප්‍රාථමික-නුපුහුණු (PL 1) සේවා කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

PL 3 රු. 43,280 – 10x490 – 10x540 – 10x590 – 12x630 – 67,040/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 40,834/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

වෘත්තීය පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 11. පොත් බැඳුම්කරු (කොන්ත්‍රාත් පදනම) (01)

**බාහිර අයදුම්කරුවන්:**

තනතුරේ කාර්යයන්ට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් හතර (NVQ Level 04) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුන (03) ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.

2) වෘත්තීය පරීක්ෂණයකදී ඔප්පු කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් දෙක (NVQ Level 02) මට්ටමට නොඅඩු කුසලතා සහිතව ප්‍රාථමික-අර්ධ පුහුණු (PL 2) හෝ ප්‍රාථමික-නුපුහුණු (PL 1) සේවා කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

PL 3 රු. 43,280 – 10x490 – 10x540 – 10x590 – 12x630 – 67,040/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 40,834/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

වෘත්තීය පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 12. රියදුරු (04)

**බාහිර අයදුම්කරුවන්:**

**<u>අධ්‍යාපනික:</u>**

අවම වශයෙන් දෙවරකදී සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වීම.

**සහ**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීම සඳහා වන වලංගු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක බර වාහන පැදවීම පිළිබඳව අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීම සඳහා වන වලංගු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක බර වාහන පැදවීම පිළිබඳව අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

**සහ**

ප්‍රාථමික-අර්ධ පුහුණු (PL 2) හෝ ප්‍රථමික-නුපුහුණු (PL 1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ කේතය:**

PL 3 රු. 43,280 – 10x490 – 10x540 – 10x590 – 12x630 – 67,040/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 40,834/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

වෘත්තීය පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 13. කාර්යාල සහයක (කොන්ත්‍රාත් පදනම) (02)

**බාහිර අයදුම්කරුවන්:**

**<u>අධ්‍යාපනික:</u>**

අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීම.

**වයස් සීමාව:** වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය සහ කේතය:**

PL 1 රු. 40,500 – 10x450 – 10x490 – 7x540 – 15x590 – 62,530/-

**(DMS 01/2025 චක්‍රලේඛයට අනුව, 2026 වර්ෂය සඳහා මූලික වැටුප - රු. 38,488/-)**

**බඳවා ගැනීමේ පරිපාටිය:**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**සාමාන්‍ය කොන්දේසි:**

සියලුම අයදුම්කරුවන්;

ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුය.

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමැති විය යුතුය.

EPF සහ ETF මෙන්ම භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද වෙනත් දිරි දීමනා, ප්‍රතිලාභ ඇතුළත් වේ. ඉහත වැටුපට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමයට අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. PDF අයදුම්පතේ දෘඪ පිටපතක් (අනිවාර්යයි) සමග අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. විදේශ/පෞද්ගලික විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් නම්, එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගැනීම පිළිබඳ සාක්ෂි අමුණා තිබිය යුතුය. ඉල්ලුම් කරන ලද තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රයක් සඳහා කවර හෝ ආකාරයක උපකාර ලබා ගැනීමට ක්‍රියා කිරීම නුසුදුසුකමක් වනු ඇත.

රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් අංශ ප්‍රධානියා හරහා අධ්‍යක්ෂ ජනරාල් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ජාතික විද්‍යා පදනම පිළිබඳව සහ පුරප්පාඩු පිළිබඳ තොරතුරු www.nsf.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. අයදුම්පත් අධ්‍යක්ෂ ජනරාල්, ජාතික විද්‍යා පදනම, 47/5, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට යොමු කළ යුතුය.

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2026-06-15**

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික විද්‍යා පදනම**
**අංක 47/5, මේට්ලන්ඩ් පෙදෙස,**
**කොළඹ 07.**